**ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සහ එහි පරිපාලිතයේ "සමූහය" - 2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ("සමාගම") සහ එහි පරිපාලිතයේ "සමූහය" 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්:

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත;

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ

- සමාගම සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | සියලුම ගෙවීම් සිදු කළ යුත්තේ සහතික කරන ලද වවුචර් මත පමණක් වන අතර, ගෙවීම් නිලධාරියෙකු වෙත ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමට පෙර සියලුම වවුචර් සහතික කළ යුතුය. වර්ෂය තුළ සහතික නොකළ වවුචර් 11ක් සඳහා රුපියල් මිලියන 33.8ක වටිනාකමකින් යුත් චෙක්පත් මුද්‍රණය කර තිබූ අතර, පසුව එම චෙක්පත් සහ වවුචර් අවලංගු කර ඇත. | එම ක්‍රියාපටිපාටිය දැනටමත් ක්‍රියාත්මක කර ඇත. | ගෙවීම් සිදු කළ යුත්තේ සහතික කරන ලද වවුචර් සඳහා පමණි. |
| ආ) | නිකුත් කරන ලද සියලුම චෙක්පත්වල වලංගුභාවය, නිකුත් කළ දිනයේ සිට දින තිහකට (30) සීමා කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගැටලුව පිළිගන්නා ලදී. | සියලුම චෙක්පත්වල වලංගු කාලය නිකුත් කළ දිනයේ සිට දින තිහකට (30) සීමා කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | විශේෂිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙන් ලැබුණු රු.32,363,150ක මුදල, එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් | නිවැරදි කිරීමේ ගිණුම්කරණ ක්‍රමවේදය අනුගමනය කර ඇති අතර, බැදීම පියවීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව, ගෙවිය යුතු මුදල ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2019 වර්ෂයේදී සමාගමේ වෙනත් ආදායම් ගිණුමට මාරු කර තිබූ අතර, එමගින් සමුච්චිත හිඟය එම මුදලින් අඩු වී තිබුණි. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් එම මුදල ආපසු ගෙවන ලෙස ඉල්ලා සිටියද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 01 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | | |
| ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 ඡේදයට පටහැනිව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සකස් කිරීමේදී රු.150,000ක ටෙන්ඩර් ගාස්තු ආපසු ගෙවීමක් රු.32,000ක ටෙන්ඩර් ගාස්තු ආදායමට එරෙහිව හිලව් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ටෙන්ඩර් ගාස්තු ආදායම සෘණ ශේෂයක් පෙන්නුම් කර තිබුණි. | අනාගත මූල්‍ය ප්‍රකාශනවල සමාන ගනුදෙනු ඉදිරිපත් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ වාර්තාකරණ අවශ්‍යතාවලට දැඩි ලෙස අනුකූල වන බව කළමනාකාරීත්වය විසින් තහවුරු කරනු ලැබේ. | ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතුය. |
| ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 16 ට පටහැනිව, අනුබද්ධ සමාගම වන ලංකා ගවර්මන්ට් ඉන්ෆෝමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් කම්පැනි ලිමිටඩ් වෙතින් මාරු කරන ලද රු.5,219,499ක් වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම්, නිසි තක්සේරුවකින් තොරව සමාගමේ පොත්වල ශූන්‍ය වටිනාකමකින් සටහන් කර තිබුණි. | එම වත්කම් භෞතිකව භාරයට ගෙන, පාලනය සහ අධීක්ෂණය සඳහා වත්කම් ලේඛනයේ සටහන් කර ඇත. | ස්ථාවර වත්කම් ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව තක්සේරු කර, ඒ අනුව වාර්තා කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | වර්ෂය තුළ ඉල්ලා අස් වූ නිලධාරීන් 03 දෙනෙකුට අදාළව ගෙවිය යුතු රු.995,337ක පාරිතෝෂික මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂික ප්‍රතිපාදන සලසා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එම වසරේ ශුද්ධ අතිරික්තය අධි තක්සේරු වී තිබූ අතර වගකීම් ප්‍රමාණය ද එම ප්‍රමාණයෙන්ම අවතක්සේරු වී තිබුණි. මීට අමතරව, සමාලෝචිත වර්ෂයට අදාළව නිලධාරීන් දෙදෙනෙකු සඳහා වූ රු.1,598,700ක පාරිතෝෂික ප්‍රතිපාදනයද හඳුනාගෙන නොතිබුණි. | අදාළ කාලසීමාව තුළ සේවකයින්ට ගෙවන ලද සත්‍ය වැටුප මත පදනම්ව පාරිතෝෂික වගකීම සහ ගෙවීම් ගණනය කර ඇත. | පාරිතෝෂික වගකීම මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව හඳුනාගත යුතුය. |
| ආ) | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් විසින් ලංකා ගවර්මන්ට් නෙට්වර්ක්ට (LGN) අදාළ වත්කම්වල හිමිකාරිත්වය 2022 දෙසැම්බර් 31 දින සමාගම වෙත පවරා තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විට සමාගම සතු රු.238,819,392ක වටිනාකමකින් යුත් වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | එම වත්කම් LGN වත්කම් වාර්තා තුළ හඳුනාගෙන ඇති අතර, අදාළ රාජ්‍ය ආයතන තුළ භෞතිකව භාවිතයේ පවතී. | සමාගමට අයත් සියලුම වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| ඇ) | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් සමාගම වෙනුවෙන්, 2022 අප්‍රේල් 20 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා විදුලි සැපයුම් සේවා සඳහා රු.9,992,787ක මුදලක් සහ 2023 ජනවාරි 01 දින සිට 2024 අප්‍රේල් 30 දින දක්වා කො-ලොකේෂන් සේවා සඳහා රු.15,219,904ක මුදලක්ද ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් වෙත සෘජුවම ගෙවා ගෙවා තිබුණි. එම මුදල් සමාගම විසින් වගකීම් ලෙස හඳුනාගෙන නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී සමාගමේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | වගකීම් ලෙස හඳුනා නොගත් වියදම් ගිණුම්ගත නොකළ යුතුය. |
| ඈ) | සෞඛ්‍ය ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් සිව් දෙනෙකු සම්බන්ධයෙන් වැටුප් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දරනු ලැබුවද, ඔවුන් වෙනුවෙන් රු.2,193,600ක පාරිතෝෂික | LKAS 19ට අනුකූලව පාරිතෝෂික ප්‍රතිපාදනය හඳුනාගෙන ඇත. | පාරිතෝෂික ප්‍රතිපාදනය නිවැරදිව හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රතිපාදන සලසා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වගකීම් එම මුදලින් අධි තක්සේරු වී තිබූ අතර, වත්මන් වර්ෂයේ වියදම රු.2,913,600කින් අධි තක්සේරු වී තිබුණි. | | |

### 1.5.4 නුසුදුසු තක්සේරු කිරීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 16ට පටහැනිව, බදු ගත් ගොඩනැගිල්ලක ස්ථාපනය කර තිබූ රු.66,725,736ක වටිනාකමකින් යුත් විදුලි ස්ථාපන සහ සවිකිරීම් සඳහා ක්ෂයවීම ගණනය කිරීමේදී ඉතිරි බදු කාලසීමාව, එම ස්ථාපනවල ස්වභාවය සහ සමාගමේ අඛණ්ඩ පැවැත්මේ තත්ත්වය සැලකිල්ලට ගෙන නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය අවසානයේ විදුලි ස්ථාපන සහ සවිකිරීම්වල ශුද්ධ පොත් වටිනාකම රු.11,120,956කින් අධි තක්සේරු වී තිබුණි. | තත්ත්වයන් වෙනස් වුවහොත් හෝ සමාගම ඇවර කිරීමේ ක්‍රියාවලිය විධිමත් ලෙස ආරම්භ කළහොත්, කළමනාකාරීත්වය විසින් මෙම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර අවශ්‍ය ඕනෑම ගැලපීමක් අනාගතයට බලපාන පරිදි සිදු කරනු ඇත. | ප්‍රමිතියට අනුකූලව බදු කාලසීමාව සැලකිල්ලට ගනිමින් ක්ෂයවීම ගණනය කළ යුතුය. |

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.73,005,158ක් වූ අතර, සමුච්චිත අලාභය රු.64,897,846ක් විය. තවද, 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ සෘණ ශුද්ධ වටිනාකම රු.64,897,826ක් විය. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. . | අවදානම අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| Audit Issue | Management Comment | Recommendation |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට ශ්‍රී ලංකා සර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ගෙවිය යුතු | සමාගම් දෙකෙහිම පොත්වලින් ශේෂයන් කපා හරින ලෙස | ගැටලුව කඩිනමින් විසඳීමට ක්‍රියාමාර්ග ගත |

රු.40,215,928ක ශේෂය, සමාලෝචිත අමාත්‍යාංශය විසින් උපදෙස් යුතුය.
වර්ෂය අවසානය වන විටද පියවා දෙන ලදී.
නොතිබුණි.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 44 වන වගන්තිය | EPF සහ ETF සඳහා දායක මුදල් ගණනය කිරීමේදී, හිමිකම් නොලබන ජංගම දුරකථන දීමනාව සහ ගමන් වියදම් දීමනාව සමාගම විසින් ඇතුළත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 - 2024 කාලපරිච්ඡේදය තුළ සමාගම විසින් රු. 3,818,645 ක EPF මුදලක් සහ රු. 572,797 ක ETF මුදලක් අතිරේකව ගෙවා තිබුණි. | එම දීමනාව සේවකයාගේ නිත්‍ය ඉපැයීම්වල කොටසක් වන බව සඳහන් කර ඇත. | EPF ගණනය කිරීමේදී පනතේ සඳහන් දීමනා සැලකිල්ලට ගත යුතුය. |
| ආ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 10 ඡේදය | මූල්‍ය නොවන වත්කම් සම්බන්ධ තොරතුරු සමාගම විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ICTA විසින් අදාළ වර්ෂය දක්වා වූ මූල්‍ය නොවන වත්කම් සම්බන්ධ සමීක්ෂණ මණ්ඩල වාර්තාව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව සියලුම වත්කම් පිළිබඳ විස්තර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කළ යුතුය. |
| ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021. මෙහෙයුම් අත්පොත 2.3 වගන්තිය | සියලුම SOE විසින් රාජ්‍ය ව්‍යාපාර | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිපාලන | මෙහෙයුම් අත්පොතට අනුව, සමාගමේ පරිපාලන |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද තමන්ගේම පරිපාලන හා මූල්‍ය අත්පොතක් අනුගමනය කළ යුතු වුවද, සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | හා මූල්‍ය අත්පොත පවතින බව. | හා මූල්‍ය අත්පොත සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් අනුමැතිය ලබා ගත යුතුය. |
| 3.8 වගන්තිය | රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින්ට සන්නිවේදන පහසුකම් සැපයීම මීට පෙර නිකුත් කරන ලද රජයේ චක්‍රලේඛ මත පදනම් විය යුතුව තිබුණද, චක්‍රලේඛවල කිසිදු ප්‍රතිපාදනයක් නොතිබූ ව්‍යාපෘති නිලධාරී/ව්‍යාපෘති සහායක සහ රියදුරු කාර්ය මණ්ඩලය වෙත දුරකථන දීමනා ලෙස රු. 1,664,466ක් සමාගම විසින් ගෙවා තිබුණි. | පිළිගන්නා අතර, SOE මාර්ගෝපදේශවල ඇමුණුම A අනුව ICTA අධ්‍යක්ෂ මණ්ඩලයට ඒ සඳහා බලය ඇත. | ඇමුණුම A හි ඇතුළත් සමාගම් වුවද, PED චක්‍රලේඛවලට අනුකූලව සන්නිවේදන පහසුකම් ලබා දිය යුතුය. |
| 6.7 වගන්තිය | ලංකා ගවර්මන්ට් නෙට්වර්ක් (LGN) 2.0 ව්‍යාපෘතිය යටතේ පවතින රු. 238,819,392 ක් වටිනා වත්කම් වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය මගින් තහවුරු කර නොතිබුණි. | එය පිළිගන්නා අතර, වත්කම් අදාළ ආයතන වෙත පවරා ඇත. | සියලුම වත්කම් වාර්ෂිකව සමීක්ෂණ මණ්ඩලයක් මගින් තහවුරු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමාගමේ සහ සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය පිළිවෙලින් රු.73,005,158ක සහ රු.28,801,381ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව සමාගමේ ඉකුත් වර්ෂයේ හිඟය රු. 4,120,754ක් වූ අතර, සමූහයේ අතිරික්තය රු.957,999ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයේ රු.77,125,912ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ලංකා ගවර්මන්ට් ඉන්ෆෝමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) වෙත ගෙවිය යුතු රු.44,001,286ක මුදල ආපසු ලියා හැරීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇත

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් අලාභ

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| LGN 2.0 ව්‍යාපෘතිය යටතේ ස්ථාන තුනක පැවති උපකරණ/උපාංග අතුරුදන් වී තිබූ අතර, එම අතුරුදන් වූ අයිතමවල මුළු පිරිවැය ආසන්න වශයෙන් රු. 5,847,912ක් විය. එම අලාභයට වගකිව යුතු පුද්ගලයා හඳුනා ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පළමු ස්ථානයේ උපකරණ අතුරුදන් වී ඇති බවත්, අනෙකුත් ස්ථාන දෙක සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු විසින් පොලීසිය වෙත පැමිණිලි කර ඇති බවත්, විමර්ශන ක්‍රියාත්මක වෙමින් පවතින බවත් සඳහන් කරන ලදී. | අලාභයට වගකිව යුතු පුද්ගලයින් හඳුනා ගැනීමටත්, අලාභය අයකර ගැනීමටත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | අඛණ්ඩ සේවා කාලය වසර 5ක් සම්පූර්ණ කර නොතිබූ, අර්ධකාලීන කොන්ත්‍රාත් පදනම මත ප්‍රසම්පාදන විශේෂඥයෙකු ලෙස බඳවා ගත් නිලධාරියෙකුට වසර 7ක් සඳහා රු.451,500ක මුදලක් පාරිතෝෂික දීමනාව ලෙස ගෙවා ඇත. | **නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනිමින් පවතී.** | අඛණ්ඩ වසර පහකට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන්ට පමණක් පාරිතෝෂික ගෙවිය යුතුය. |
| ආ) | “e-Library” ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බිල් ඇන්ඩ් මෙලින්ඩා ගේට්ස් පදනම වෙතින් ලැබුණු රු. 121,582,863ක මුදල, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර, 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සමාගමේ ආදායමෙහි වෙනත් ආදායම් ලෙස ඇතුළත් කර තිබුණි. | එම කරුණ පිළිගනු ලැබේ. | ව්‍යාපෘති සඳහා ලැබෙන අරමුදල් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කළ යුතුය. |
| ඇ) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රධාන තීරණයට පටහැනිව සේවකයින් 30 දෙනෙකුට වැටුප් වර්ධක ලබාදීම හේතුවෙන් වැටුප් සංශෝධන අවලංගු බවට 2023 සැප්තැම්බර් 14 දිනැති අංක E/112/2023/ICTA දරන නීතිපතිවරයාගේ ලිපිය මගින් සමාගම වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව, සමාගම විසින් 2024 | 2022 සිට 2024 දක්වා කාලය තුළ සිදු වූ වැටුප් අධිගෙවීම් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | වැටුප් අධිගෙවීම් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු |

| | | | |
|---|---|---|---|
| | පෙබරවාරි මාසය දක්වා රු.8,123,167ක වැටුප් අධි ගෙවීමක් සිදු කර තිබුණි. | | |
| ඇ) | සමාගම් පනතේ 242 වන වගන්තියට අනුකූලව, 2022 නොවැම්බර් 15 දින පැවති සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, අනුබද්ධ සමාගම වන ලංකා ගවර්මන්ට් ඉන්ෆෝමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ ඒකාබද්ධ වීමට අනුමැතිය ලබා දී තිබුණද, 2025 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යය සම්පූර්ණ කර නොතිබුණි. | ඒකාබද්ධ කිරීම වෙනුවට ලේඛනයෙන් ඉවත් කිරීමේ ක්‍රියාමාර්ගය ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කිරීම. | අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට අනුව අනුබද්ධ සමාගම වසා දැමීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| ඉ) | 2023 දෙසැම්බර් 18 දිනැති අංක 23/2443/630/009 දරන කැබිනට් පත්‍රිකාවේ 3.5 ඡේදය අනුව, එම සමාගම විසුරුවා හැරීමේ බලතල භාණ්ඩාගාර ලේකම්වරයා වෙත පවරා තිබූ අතර, 3.6 ඡේදය අනුව සමාගම විසින් ක්‍රියාත්මක කරමින් පැවති ව්‍යාපෘති, අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත පැවරිය යුතුව තිබුණි; සමාගමේ සාංගමික ව්‍යාවස්ථාවලිය සහ 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනතේ විධිවිධානවලට අනුකූලව ඒ සඳහා වන කැබිනට් අනුමැතිය 2023 දෙසැම්බර් 18 දින ලබාගෙන තිබුණි. එසේ කටයුතු කිරීමකින් තොරව සමාගම තවදුරටත් ක්‍රියාත්මක විය. | සමාගම අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින්, පවතින රජයේ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, එම වගකීම් භාර ගැනීම සඳහා විකල්ප ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම ද සිදු කරන ලදී. | සමාගම විසුරුවා හැරීම සඳහා ලේකම්වරයා වෙත බලය පවරා, සමාගම විසින් ක්‍රියාත්මක කරමින් පවතින ව්‍යාපෘති, අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත පැවරිය යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන 860ක් සම්බන්ධ කරමින් 2017 වර්ෂයේදී ලංකා ගවර්මන්ට් නෙට්වර්ක් (LGN) ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, LGN 2.0 හි මාසික සාමාන්‍ය කලාප පළල භාවිතය පිළිබඳ ලේඛණය අනුව, 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සක්‍රීයව පැවති | කලාප පළල භාවිතය දිරිමත් කිරීම සඳහා අදාළ ආයතන සම්බන්ධ කර ගන්නා ලදී. සේවා සපයන්නා විසින් තාක්ෂණික ගැටලු නිවැරදි කර ඇත. | භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

ස්ථාන සංඛ්‍යාව 817ක් පමණක් විය. මෙහිදී ආයතන 29කට අදාළ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබූ අතර, තාක්ෂණික ගැටලු හේතුවෙන් තවත් ස්ථාන 31ක් දත්තවලට ඇතුළත් වී නොතිබුණි. තවද, ස්ථාන 25ක මාසික සාමාන්‍ය කලාප පළල භාවිතය ශූන්‍ය ලෙස වාර්තා වී තිබුණි.

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කුලී පදනම මත ලබාගත්, කාර්ය මණ්ඩල සාමාජිකයින් 235 දෙනෙකු සඳහා ප්‍රමාණවත් වූ ගොඩනැගිල්ල, සමාලෝචිත වර්ෂය තුළ කාර්ය මණ්ඩල සාමාජිකයින් 42 දෙනෙකු සඳහා පමණක් භාවිත කර ඇත. ඒ අනුව, වර්ග අඩි 14,436ක ඉඩ ප්‍රමාණයක් සඳහා රු. 32,397,546ක කාර්යාල කුලී මුදලක් නිෂ්ඵල ලෙස ගෙවා තිබූ අතර, රු. 20,248,135ක් වටිනා කාර්යාලීය ගෘහ භාණ්ඩ ද නිෂ්ක්‍රීයව තබා තිබුණි. | 2023 දෙසැම්බර් 18 දින නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල නියෝගය මගින් මෙහෙයුම් කටයුතු ක්‍රමයෙන් අවසන් කිරීමට උපදෙස් ලබා දී තිබූ අතර, එමඟින් සේවක පිරිවැටුම ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, සත්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව වාර්ෂිකව අඩු විය. | වත්කම් උපරිම විභවයෙන් ප්‍රයෝජනයට ගත යුතුය. |

### 3.5 වෙනත් සංවිධාන වලට මුදාහැරි සම්පත්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි 3.5 වගන්තියේ විධිවිධානවලට අනුව, අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රජය සතු ව්‍යාපාරයක සේවකයෙක්, අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට මුදා හැරීම නොකළ යුතු අතර, එසේ මුදා හැර සිටින කාලසීමාව තුළ කිසිදු දීමනාවක් නොගෙවිය යුතුය. කෙසේ වෙතත්, එවැනි අනුමැතියක් ලබා නොගෙන එක් නිලධාරියෙකු තාක්ෂණ අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි. 2022, 2023 සහ 2024 යන වර්ෂවලදී, පිළිවෙලින් රු. 2,240,200ක්, රු. 2,376,360ක් සහ රු. 2,376,360ක මුදලක් වැටුප්, දුරකථන දීමනා සහ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා වන දායක මුදල් ලෙස ගෙවා තිබුණි. | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉල්ලීමක් කර ඇති බව පිළිගන්නා බව | නිලධාරීන් අමාත්‍යාංශය වෙත මුදා හැරීමට පෙර අදාළ අනුමැතිය ලබා ගත යුතුය |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය අනුව, මූල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත්, මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ දින 375කට පසුවය. | ICTA විසින් කෙටුම්පත් වාර්ෂික ගිණුම් ඉදිරිපත් කර, අවසන් ඉදිරිපත් කිරීමේ දිනය දක්වා අවස්ථා කිහිපයකදී ඒවා නැවත ඉවත් කරගෙන තිබුණි. | මූල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 අරමුණු සහ සංයුක්ත සැලැස්ම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත, 2008 අංක 33 දරන සංශෝධන පනත මගින් සංශෝධනය කර ඇති පරිදි, එහි බලතල හා කාර්යයන්ට, ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට සහාය වීම, උපායමාර්ග හා වැඩසටහන් සකස් කිරීම සහ ශ්‍රී ලංකාව තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ජනප්‍රිය කිරීමේ ක්‍රමවේද හඳුනා ගැනීම ඇතුළත් වේ. කෙසේ වෙතත්, එම කාර්යයන් සමාගම විසින් ක්‍රියාත්මක කරනු නොලැබීය. | අමාත්‍යාංශ අතර කමිටුවක් නොතිබීම, කොවිඩ්-19 වසංගතය, ඉන් අනතුරුව ඇති වූ ආර්ථික අර්බුදය, වියදම් සීමා කිරීම්, බඳවා ගැනීම් සීමා කිරීම් සහ ඉහළ සේවක පිරිවැටුම හේතුවෙන් මෙම කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව සඳහන් කරන ලදී. | සමාගම සිය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ආ) | 2023 දෙසැම්බර් 19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020–2024 උපායමාර්ගික සැලැස්ම අත්හිටුවීමට තීරණය කර තිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අනුව, සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද රු. මිලියන 357.88ක පිරිවැයක් සහිත ව්‍යාපෘති 06ක භෞතික ප්‍රගතිය සියයට 23 සිට සියයට 55 දක්වා වූ අඩු මට්ටමක පැවතුණි. | කරුණක් ලෙස පිලිගනී. | සැලසුම් කළ ක්‍රියාමාර්ග සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4.3. අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | අභ්‍යන්තර විගණක තනතුර 2023 පෙබරවාරි මාසයේ සිට 2025 දෙසැම්බර් 31 දක්වා බඳවා ගැනීමකින් තොරව පුරප්පාඩුව පවතී | 2026 ජනවාරි 12 දින සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ඇත. | අභ්‍යන්තර විගණකවරයෙකු අඛණ්ඩව සේවයේ සිටිය යුතුය. |
| ආ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මගින් හඳුන්වා දී ඇති ආයතනික පාලන මාර්ගෝපදේශයෙහි 4.2 වගන්තිය අනුව, විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 03කට වරක් රැස්විය යුතු වුවද, 2024 වර්ෂයෙදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | ඒ බව පිළිගන්නා අතර, මණ්ඩල සංයුතියේ සිදුවූ වෙනස්කම් කිහිපයක් හේතුවෙන් මෙය සිදුවී ඇත. | විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 03කට වරක් රැස්විය යුතුය. |